<u>තිරප්පනේ ප්‍රාදේශීය සභාව.</u>

<u>**2022.12.09** වන දින පෙ.ව **10.00** ට පැවති මහ සභා රැස්වීම.</u>

***<u>පැමිණ සිටි ගරු මන්ත්‍රීවරුන්:</u>***

1. ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා - ගරු සභාපතිතුමා
2. ඒ. අන්වර් සදාක් මැතිතුමා - ගරු සභික තුමා
3. එස්.තිස්ස විජේසිංහ මැතිතුමා - ගරු සභික තුමා
4. එච්.එම්.නාසිම් මැතිතුමා - ගරු සභික තුමා
5. ජී.නිමල් රාජපක්ෂ මැතිතුමා - ගරු සභික තුමා
6. එච්.බී.නලින් හේරත් මැතිතුමා - ගරු සභික තුමා
7. කේ. නදීකා සෙව්වන්දි කරුණාරත්න මැතිනිය - ගරු සභික තුමිය
8. ටී.එම්.තිළිණ රසාංග තිලකරත්න මැතිතුමා - ගරු සභික තුමා
9. ටිකිරි බංඩාර වනසිංහ මැතිතුමා - ගරු සභික තුමා

***<u>නොපැමිණි ගරු මන්ත්‍රීවරුන් :</u>***

1. ඒ.ජී.මරියහාමි මැතිනිය - ගරු උපසභාපතිතුමිය
2. පී.මධුර කුමාර පියරත්න මැතිතුමා - ගරු සභික තුමා
3. බී.ආර්.තිලක් සුසන්ත රාජකරුණා මැතිතුමා - ගරු සභික තුමා
4. ආර්. ප්‍රියංගන ප්‍රසාද් කුමාර රත්නායක මැතිතුමා - ගරු සභික තුමා
5. ආර්.පී.නිසංසලා ලක්මාලි අබේරත්න මැතිනිය - ගරු සභික තුමිය
6. එන්.රශ්මි සංකල්පනා මැතිනිය - ගරු සභිකතුමිය
7. ජේ.රෝහණ විජේතිලක මැතිතුමා - ගරු සභික තුමා

***<u>සහභාගී වූ නිළධාරීන් ;</u>***

1. ආර්.පී.පී. රේණුකා ලියනගේ මිය - ලේකම්
2. එම්.ආර්.ඩබ්.සී.කේ.රණවීර මිය - විෂය භාර නිලධාරී

**<u>(අ) පසුගිය රැස්වීම් වාර්තා සම්මත කිරීම.</u>**

**- <u>2022.11.10 දින පැවති ගරු මහා සභා වාර්තාව සහ 2022.11.29 දින පැවති විශේෂ මහ සභා වාරයේ සභා වාර්තාව සභා සම්මත කිරීම.</u>**

අද දිනට නියමිත ගරු මහා සභාවේ න්‍යාය පත්‍රයේ මුලින්ම තිබෙන්නේ 2022.11.10 දින පැවති ගරු මහා සභා වාර්තාව සහ 2022.11.29 දින පැවති විශේෂ මහ සභා වාරයේ සභා වාර්තාව සභා සම්මත කර ගැනීමයි.ඒ අනුව පසුගිය මෙම සභා වාර්තාවලට සංශෝධන තිබේනම් ඒවා ඉදිරිපත් කරන ලෙසත්, පසුගිය සභා වාර්තා සභා සම්මත කර ගන්නා ලෙසත් මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා.**

**ලිපි අංක - I .**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

කෘෂි නිෂ්පාදන සඳහා පොදු වෙළෙඳසැලක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව අවලංගු කිරීම සම්බන්ධයෙන් කරන ලද දැනුම් දිම අත්හිටුවා කාලය දීර්ඝ කර පවතින මිල ගණන් යටතේ කරගෙන යාමට ඉල්ලුම් කරමින් IPS ආයතනයේ කළමණාකාර අධ්‍යක්ෂක විසින් එවා ඇති ලිපිය ගරු මහා සභාවේ සුදුසු තිරණයක් ගැනීමට ඉදිරිපත් කර සිටිනවා.මෙම ලිපියේ ,මෙම ව්‍යාපෘතිය අමු ද්‍රව්‍යවල හිඟතාවය සහ අධික මිල වැනි හේතු නිසා නියමිත කාලය තුළ නිමා කිරීමට නොහැකි වූ බව සඳහන් කර තිබෙනවා.

**යෝජනා අංක 184–12-2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික -ඒ. අන්වර් සදාක් මැතිතුමා.**

කෘෂි නිෂ්පාදන සඳහා පොදු වෙළෙඳසැලක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව අවලංගු කිරීම සම්බන්ධයෙන් කරන ලද දැනුම් දිම අත්හිටුවා කාලය දීර්ඝ කර පවතින මිල ගණන් යටතේ කරගෙන යාම සුදුසු බව යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ජී.නිමල් රාජපක්ෂ මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>යෝජනා අංක 184–12-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි,ගරු මහ සභාවෙන් අවසරයි.2022.10.12 දින පැවති ගරු මහා සභා වාර්තාවේ සංශෝධනයක් තියෙනවා. පිටු අංක 14, ලිපි අංක VII යටතේ යෝජනා ස්ථිර වුනේ එක් පුද්ගලයෙක් මෙම දහම් පාසල් ගොඩනැඟිල්ල ඉදි කිරීමට යෝජිත ඉඩමේ එක් පුද්ගලයෙක් කඩ කාමරයක් පවත්වා ගෙන යනවා.එම පුද්ගලයාට අවහිරයක් නොවන පරිදි දහම් පාසල් ගොඩනැඟිල්ල දිර්ඝ කාලින බදු බලපත්‍ර යටතේ ලබා දීම සුදුසු බවට යෝජනා කරන අතර , ඒ අනුව සංශෝධනයන්ට යටත්ව 2022.10.12 දින පැවති මහා සභා වාර්තාව සත්‍ය හා නිවැරදි බවට මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික -ඒ. අන්වර් සදාක් මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් 2022 ඔක්තෝබර් මස 12 වන දින පැවති ගරු මහා සභා වාර්තාව පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.*

***2022.10.12 දින මහා සභාවේ සංශෝධනය විය යුතු කොටස.***

- **පිටු අංක 14 හි,**

**ලිපි අංක - VII .**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

539 වෙල්ලමුදාව ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ ශ්‍රී සුමනසාර දහම් පාසල් ගොඩනැගිල්ල ඉදිකිරීමට යෝජිත ඉඩම සඳහා දීර්ඝ කාලීන බදු බලපත්‍ර ලබා දීම සඳහා නිර්දේශය ඉල්ලමින් තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් එවා ඇති ලිපිය ගරු මහා සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කරනවා.

**යෝජනා අංක 157–10-2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික - පී.මධුර කුමාර පියරත්න මැතිතුමා.**

මම මෙම ස්ථානය පෞද්ගලිකව නිරීක්ෂණය කළා.මේ සඳහා පුද්ගලික විරෝධතාවයක් තිබුණා. එක් පුද්ගලයෙක් මෙම දහම් පාසල් ගොඩනැගිල්ල ඉදි කිරීමට යෝජිත ඉඩමේ එක් පුද්ගලයෙක් කඩ කාමරයක් පවත්වා ගෙන යනවා.එම පුද්ගලයාට අවහිරයක් නොවන පරිදි 539 වෙල්ලමුදාව ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ පිහිටි මෙම ඉඩමේ ශ්‍රී සුමනසාර දහම් පාසල් ගොඩනැගිල්ල ඉදිකිරීමට දීර්ඝ කාලීන බදු බලපත්‍ර ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික -ඒ. අන්වර් සදාක් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**(ආ) ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන.**

නව වසරක් උදා වීමට ආසන්න මේ මොහොතේ මට කියන්න තියෙන්නේ ප්‍රදේශයේ ජනතාවගේ බදු මුදලින් තිරප්පනේ ප්‍රාදේශීය සභාව පවත්වා ගෙන යාමට මන්ත්‍රීවරුන් විශාල සහයෝගයක් ලබා දුන්නා.යම් යම් ගැටළු ඇති වුන අවස්ථා තිබුණා.මේක අපේ අවසාන සභාව වෙන්නත් පුළුවන්.මමත් ඉස්සර හිටපු මන්ත්‍රීවරුන්ගේ සභාපතිවරුන්ගේ ආදර්ශයත් සමඟ තමා මෙම ගමන ආවේ.අපිට මේ වන විට සභාව මේ තත්ත්වයට ගෙන ඒමට විශාල කාර්ය භාරයක් අපි වරින් වර සිදු කළා.නගර සහ ගම් දියුණු කළා.අපේ තියෙන සම්පත් හා මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභාවෙන් ලද ප්‍රතිපාදන මත අපි ඉතා විශාල සේවයක් කලා. කසල සෑදිමට, මාර්ග ඉදිකිරීමට , බෝක්කු සෑදීමට විතරක් සීමා වී තිබුණු ප්‍රාදේශීය සභාව තුළින් බහුතර සේවාවක් ලබා දීමට අපිට හැකියාව ලැබුණා.ඉතාමත් අබලන් තත්ත්වයේ තිබුණු විශාල වාහන ප්‍රමාණයක් අපි මේ වන විට යථා තත්ත්වයට පත් කරලා තියෙනවා.ඒ සඳහා යම් යම් ව්‍යාපෘති වලින් සහ පළාත් සභාවෙන් ප්‍රතිපාදන ලැබුණා. එබැවින් මේ සඳහා ඔබතුමන්ලා ලබා දුන් සහයෝගය අගය කොට සලකනවා.

**(ඇ) ප්‍රාදේශිය සභාව අමතා එවන ලද සංදේශ , පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන මහා සභාවට ඉදිරිපත් කිරීම.**

- ඒ අනුව ආදායම් පරීක්ෂක මහත්මා විසින් 2022 ඔක්තෝබර් මස ආදායම් වාර්තාව ඉදිරිපත් කර සිටිනවා.ඒ අනුව ඔක්තෝබර් මස ආදායම ලෙස රු.4,002,194.00ක මුදලක් ආදායම් පරීක්ෂක මහතා විසින් එකතු කර තිබෙනවා.එයද මම දැන ගැනීම සඳහා ගරු මහ සභාවට ඉදිරිපත් කරනවා.

- 2022 නොවැම්බර් මස 01 වන දින සිට සියළුම සේවකයන්ගේ දෛනික රාජකාරී සහ පැමිණිය යුතු වේලාවන් හා සිදු කළ යුතු රාජකාරී සඳහන් දෛනික කාල සටහන ගරු මහ සභාවේ දැන ගැනීම සඳහා ගරු මහ සභාවට ඉදිරිපත් කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

උලගල්ල හෝටලයට අදාල බදු මුදල ආදායම් පරීක්ෂක මහතා බිල්පත් නිකුත් කිරීම වැරදියි.මින් ඉදිරියට ක්ෂේත්‍රයේදී එකතු කළ මුදල පමණක් මෙම වාර්තාව සඳහා අදාල කර ගන්නා ලෙස මම ඉල්ලා සිටිනවා.

**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.**

කිසිවක් නැත.

මේ සම්බන්ධයෙන් සාකච්ඡා වට කිහිපයක් තිබ්බා.ඒ අනුව අඩුපාඩු සකස් කළා.මේ අනුව 2023 වර්ෂයේ මුළු ආදායම ලෙස රු.43,339,287.00 ක මුදලකුත් ලෙසත් මුළු වියදම ලෙස රු. 43,280,459.00 ක මුදලකුත් අතිරික්තය ලෙස රු.58,828.00 ක මුදලකුත් ලෙස ගණනය කරලා තියෙනවා.ඒ අනුව මෙම අයවැය ඉදිරි වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා සම්මත කර දෙන ලෙස මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

__ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා__

__යෝජනා අංක 163–11-2022.__

මම හිතන්නේ අපි සභාවට පත් වෙලා දැනට අවුරුදු 09 ක පමණ කාලයක් වෙනවා.මෙය අවසාන සභා වාරයද වෙන්න පුළුවන්.මෙම කාලය තුළ ප්‍රාදේශීය සභාවට යටත් පුද්ගලයින්ගේ සුභ සාධනය සඳහා 100% ක දායකත්වයත් ලබා දීමට නොහැකි වුනත් මට හැකි ආකාරයෙන් දායකත්වය ලබා දුන්නා.මෙම ප්‍රාදේශීය සභාව තමා අඩු ආදායම්ලාභී ප්‍රාදේශීය සභාවක් වශයෙන් අවුරුදු 20ක දේශපාලන ජීවිතේදී මම අහලා තියෙන්නේ.ඉදිරියේදීවත් මෙම ස්ථානය වෙනස් වේවායි ප්‍රාර්ථනා කරනවා.මේ අයවැය වාර්තාව පිළිබඳව අපට සතුටු වීමට නොහැකියි.අපේ සම්පත් අපට නිසි ආකාරයෙන් ප්‍රයෝජනයට ගන්න බැරිවුණා.ඒ සඳහා නිසි කළමනාකාරීත්වයක් තිබුණේ නෑ.දැනට අපි වාහන අළුත්වැඩියා කරලා තියෙන්නේ.අපේ සභාවේ අනවශ්‍ය වියදම් කපා හැරලා නිලධාරින් සහ සේවකයන් නිසි කළමණාකාරිත්වය අනුව ඉදිරියට කටයුතු කරන්න අපට හැකියාව ලැබේවායි අපි ප්‍රාර්ථනා කරමු.මේ අයවැය වාර්තාවේ තියෙන දේවල් අපට වෙනස්කළ නොහැකියි.ඒ අනුව 2023 වර්ෂයේ සකස් කළ අයවැය ක්‍රියාත්මක කිරිමට සුදුසු බවට මම යෝජනා කරනවා.

__ගරු ප්‍රාදේශීය සභා සභික -ඒ. අන්වර් සදාක් මැතිතුමා.__

සභාපතිතුමන් විසින් සියළුම මන්ත්‍රී මණ්ඩලය හමුවේ සියළු දෙනාගේම අදහස් අරගෙන 2023 වර්ෂයේ අයවැය කෙටුම්පත් කර තියෙනවා.ඒ අනුව 2023 වර්ෂය සඳහා සකස් නව අයවැය කෙටුම්පත 2023 වර්ෂයේ ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරනවා.

__ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජේතිලක මැතිතුමා.__

සියළු දෙනාගෙන්ම අවසරයි.අවුරුදු 20-22 ක් තුළ මෙම සභාවේදී මේ අයවැයට අදාළ කිසිදු කාර්යයක් සිදු කළේ නෑ.හැම වාරයකම අයවැය ගතහොත් විරුද්ධ වීමට කරුණු කාරණා තිබ්බත් මෙම වාරයේදි විරුද්ධ වීමට කිසිදු කාරණයක් නෑ.

__ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.__

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ ඒකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

__ලිපි අංක - II .__

__ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.__

2020 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරන ලද පෙරියකුලම විහාරස්ථානයේ සිට මානක්කුලම දක්වා ප්‍රධාන මාර්ගය කුට්ටිගල් අතුරා සංවර්ධනය කිරීම නැමැති ව්‍යාපෘතිය සඳහා පළාත් පාලන ආයතන වලින් සම්බන්ධවන නිලධාරීන් සඳහා අධීක්ෂණ වියදම් වලින් දීමනාවක් ගෙවීම සම්බන්ධයෙන් පළාත් පාලන

දෙපාර්තමේන්තුව මඟින් එවා ඇති ලිපියට අනුව අදාළ මුදල් ගෙවීම සඳහා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහා සභාවේ සුදුසු තීරණයක් ගැනීමට ඉදිරිපත් කර සිටිනවා.

<u>**යෝජනා අංක 164–11-2022.**</u>

<u>**ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**</u>

මෙම මාර්ගයේ කුට්ටිගල් ඇතිරීමක් වුනේ නෑ.පොඩි කොටසක් තමා ක්‍රියාත්මක වුනේ.බොරළු දාන්න පුළුවන් වුණා නම් මාර්ගය සකස් කරන්න තිබුණා.යම් කිසි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේදී ඒ සඳහා දායක වු නිලධාරින්ට ගෙවීමේ හැකියාව ඇත්නම් එම මුදල ගෙවීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>**ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජේතිලක මැතිතුමා.**</u>

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**</u>

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ ඒකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

<u>**ලිපි අංක - III .**</u>

<u>**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**</u>

තිරප්පනේ ප්‍රාදේශීය සභාවේ සහකාර ගිණුම් නිලධාරි ලෙස සේවයේ යෙදී සිටින ආර්.එම්.කේ .චන්ද්‍රසිරි මිය පළාත් පාලන මූල්‍ය කළමණාකරණ ඩිප්ලෝමාව සඳහා මාස 06 ක කාල සීමාවක් තුළ සෙනසුරාදා දින සහභාගී වීම වෙනුවෙන් අතිකාල දීමනා ඉල්ලුම් කරමින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහා සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

<u>**යෝජනා අංක 165–11-2022.**</u>

<u>**ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**</u>

සේවකයෙකු ආයතනය සම්බන්ධ රාජකාරියක් සිදු කර අදාළ මුදල් ලබා දිම සුදුසුයැයි මම යෝජනා කරන අතරම, පුහුණුව ලද සේවකයාගෙන් ඉතා හොඳ කාර්යක්ෂම සේවයක් බලාපොරොත්තු වෙනවා.

<u>**ගරු ප්‍රාදේශීය සභා සභික - බී.ආර්.තිලක් සුසන්ත රාජකරුණා මැතිතුමා.**</u>

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**</u>

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ ඒකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

<u>**ලිපි අංක - IV .**</u>

<u>**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**</u>

තිරප්පනේ ප්‍රාදේශීය සභාවට අයත් සිහිනි පෙර පාසලේ විසිර යාමේ උත්සවය සඳහා දරුවන් 36 දෙනෙකුට සහතිකපත්‍ර සහ ත්‍යාග ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු කරන ලෙස ඉල්ලමින් පෙර පාසල් පාලිකාව විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහා සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කර සිටිනවා. මේ සඳහා අවම වශයෙන් රු.20,000.00 ක මුදලක් වැය වේ යැයි බලා පොරොත්තු වෙනවා.

**<u>යෝජනා අංක 166–11-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - පී.මධුර කුමාර පියරත්න මැතිතුමා.</u>**

සිහිති පෙර පාසලේ විසිර යාමේ උත්සවය සඳහා දරුවන් 36 දෙනෙකුට සහතිකපත්‍ර සහ ත්‍යාග ලබා දීම සඳහා අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමේ කටයුතු සිදු කිරිම සුදුසු බවටත් මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - එච්.එම්.නාසිම් මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>ලිපි අංක - V .</u>**

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

ලිපි ගොනු තබා ගැනීම සඳහා අල්මාරියක් ඉල්ලමින් කලමනාකරණ සේවා නිලධාරි එන්.එම්.එන්.යූ.නවරත්න මිය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහා සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

**<u>යෝජනා අංක 167–11-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - බී.ආර්.තිලක් සුසන්ත රාජකරුණා මැතිතුමා.</u>**

කලමනාකරණ සේවා නිලධාරි එන්.එම්.එන්.යූ.නවරත්න මියට ලිපි ගොනු තබා ගැනීම සඳහා අල්මාරියක් ලබා දීම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - එන්.රශ්මි සංකල්පනා මැතිණිය.</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>ලිපි අංක - VI .</u>**

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වත්කම් හා භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කිරිම සඳහා නිලධාරින් පත් කර ගැනීම සම්බන්ධයෙන් අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලමින් කලමනාකරණ සේවා නිලධාරි එම්.ආර්.ඩබ්.සි.කේ.රණවීර මිය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහා සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කරනවා.

**<u>යෝජනා අංක 168–11-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වත්කම් හා භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කිරිම සඳහා නිලධාරින් පත් කර ගැනීම සම්බන්ධයෙන් අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරන අතරම ඒ සඳහා සාමාජිකයෙක් ලෙස සභාව නියෝජනය කරමින් උප සභාපති ඒ.ජී.මරියභාමි මැතිණිය මේ සඳහා සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ජී.නිමල් රාජපක්ෂ මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසිමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>ලිපි අංක - VII .</u>**

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

විදුලි පංකාවක් සහ ලිපි ගොනු තබා ගැනීම සඳහා අල්මාරියක් ඉල්ලමින් සංවර්ධන නිලධාරී ජී.පී.ඒ.කීර්තිසේන මයා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහා සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

**<u>යෝජනා අංක 169–11-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික -ඒ. අන්වර් සදාක් මැතිතුමා.</u>**

සංවර්ධන නිලධාරී ජී.පී.ඒ.කීර්තිසේන මයා හට ලිපි ගොනු තබා ගැනීම සඳහා අල්මාරියක් සහ විදුලි පංකාවක් ලබා දීම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ජී.නිමල් රාජපක්ෂ මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසිමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>ලිපි අංක - VIII .</u>**

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

ඉඩම් පරිහරණ කමිටුවේදී සාකච්ඡා කරන ලද පුද්ගලයින් හට රජයේ ඉඩම් ලබා දිම සම්බන්ධයෙන් නිර්දේශය ඉල්ලමින් තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් එවා ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

**<u>යෝජනා අංක 170–11-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - පී.මධුර කුමාර පියරත්න මැතිතුමා .</u>**

ප්‍රදේශයේ සිටින මන්ත්‍රීවරයා මේ සඳහා පරීක්ෂා කර වාර්තාවක් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

මේ ඉඩම මැදින් තම්මැන්නාගලට යන්න පාරක් තිබුණා.නමුත් වාචික තොරතුරු පමණයි තියෙන්නේ.ඒ වගේම පරිසර කමිටුවට ඉතා විශාල වගකීමක් තියෙනවා. කමිටු දාලා තියෙන්නේ මේවාට ගතවෙන කාලය අඩු කර ගන්න.මේ සඳහා ස්වේච්ඡා සංවිධාන හා ග්‍රාම නිලධාරිවරයාගේ නිර්දේශය ලබා ගත යුතුයි.රජයේ නිලධාරියෙකුට දීර්ඝ කාලීන බදු බලපත්‍ර ලබා දිය යුතු යැයි නිර්දේශිත ප්‍රමාණයක් තිබෙනවා.ඒ නිසා මේ සම්බන්ධ ගැටළු තියෙනවා නම් ඒවා විසඳා ගෙන සභාවට සභාවට ඉදිරිපත් කරන්න.ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් මේ අයට ඉඩම් ලබා දෙන්න උනන්දු වුනත් පර්චස් 10 ක් වත් නැති මිනිස්සු ගොඩක් ඉන්නවා.ඒ නිසා මේ සඳහා පැහැදිලි වාර්තාවක් ලබා දෙන ලෙස ඉල්ලා සිටින අතරම මධුර මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>ලිපි අංක - IX.</u>**

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

LL-7713 අංක දරණ කෘෂ කැබ් රථයේ බ්‍රේක් පද්ධතිය අළුත්වැඩියා කිරීම, බැටරිය, දොර ලොක් සවි කිරීම, පිටුපස ෂීට් කුෂන් කිරීම, කවර දැමීම, මීටරය ක්‍රියා විරහිත වීම, වයිසර් බ්ලේඩ් 02 අළුතින් දැමීම යන අළුත්වැඩියාවන් කිරීම සඳහා සී.බී.දිසානායක මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහා සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කරනවා.

**<u>යෝජනා අංක 171–11-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

මේකේ මීටරය සවි කිරීම සඳහා අනුමැතිය ලබා දිය නොහැකියි.කාර්ය මණ්ඩලය හා මහජන නියෝජිතයන් විසින් මෙම වාහනය ඉතා අපහසුවෙන් සකස් කරලා තියෙනවා.විශේෂයෙන් වාහන නිසි ආකාරයෙන් නඩත්තු කරන ලෙස රියදුරන් දැනුවත් කරන්න.ඒ අනුව ඉහත අළුත්වැඩියාවන් සිදු කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ජී.නිමල් රාජපක්ෂ මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>ලිපි අංක - X.</u>**

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

2022 සැප්තැම්බර්, ඔක්තෝම්බර්,නොවැම්බර් මාස වලට අදාළ අතිකාල තක්සේරු වාර්තා ගරු මහා සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

**<u>යෝජනා අංක 172–11-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික -ඒ. අන්වර් සදාක් මැතිතුමා.</u>**

2022 සැප්තැම්බර්, ඔක්තෝම්බර්,නොවැම්බර් මාස වලට අදාළ අතිකාල තක්සේරු වාර්තා අනුව අතිකාල ලබා දීම සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - එන්.රශ්මි සංකල්පනා මැතිණිය.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක - XI.**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

තිරප්පනේ ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු මාර්ග කම්කරු පී.එච්.අජිත් පුංචිහේවා මයා විසින් ආපදා ණය මුදල ලබා දෙන ලෙස ඉල්ලමින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහා සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

**යෝජනා අංක 173–11-2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

අපට මුදල් අතින් ආර්ථික අපහසුතා එනවා.ඒ අනුව මාර්ග කම්කරු පී.එච්.අජිත් පුංචිහේවා මයා හට ආපදා ණය මුදල ලබා දීම සුදුසු බවට යෝජනා කරනවා.එමෙන්ම ආපදා ණය මුදල ලබා දීම සම්බන්ධයෙන් පොරොත්තු ලේඛණයක් පවත්වා ගෙන යාමට කටයුතු කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ. අන්වර් සදාක් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක - XII.**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

සෙලෙස්තිමඩුව වෙල්මුදාව මාර්ගය දෙපස එළිපෙහෙළි කර ගැනීම සම්බන්දයෙන් පී.මධුර කුමාර පියරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහා සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

**යෝජනා අංක 174–11-2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික - පී.මධුර කුමාර පියරත්න මැතිතුමා .**

සෙලෙස්තිමඩුව වෙල්මුදාව මාර්ගයේ ශ්‍රමදානය සඳහා ඒ අවට මහජනතාව 100 ත් පමණ මේ සඳහා සහභාගී වෙනවා. එබැවින් මේ සඳහා රු.10,000.00 ක මුදලත් ලබා දීම සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - එච්.එම්.නාසීම් මැතිතුමා.**

පරිසර කමිටුවට මම තමා මේ යෝජනාව ඉදිරිපත් කළේ.මේ මාර්ගයේ ජනතාව විශාල වශයෙන් ගමන් කරනවා.එබැවින් මෙම මාර්ගය එළිපෙහෙළි කිරීම සුදුසු බවටත් මේ සඳහා රු.10,000.00 ක මුදලක් ලබා දිම සුදුසු බවටත් ගෙන ආ යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>ලිපි අංක - XIII.</u>**

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

තිරප්පනේ ප්‍රාදේශීය සභාවේ සේවක සුභ සාධන සමිතියෙන් වාර්ෂික අධ්‍යයන චාරිකාවක් යාම සඳහා සභා අරමුදලින් රු.50,000.00 ක මුදලක් ලබා දෙන ලෙස සේවක සුභ සාධන සමිතියෙන් ඉදිරිත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

**<u>යෝජනා අංක 175–11-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

සේවකයන් තෘප්තිමත් කර කාර්යාලයේ කාර්යයන් නිසි ආකාරයෙන් සිදු විය යුතුයි.එමෙන්ම අප දෙගොල්ලක් අතර සුහදතාවය වර්ධනය කරගෙන මෙම ගමන යා යුතුයි.එබැවින් මෙම මුදල වෙන් කිරීමට හැකියාවක් ඇත්නම් එම මුදල වෙන් කිරිම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ. අන්වර් සදාක් මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>ලිපි අංක - XIV.</u>**

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

තිරප්පනේ ප්‍රාදේශීය සභාවට අයත් RF-4767 අංක දරණ ට්‍රැක්ටර් රථය සඳහා නව බැටරියක් ඉල්ලමින් ජේ.කුමාරසිංහ මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

**<u>යෝජනා අංක 176–11-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ. අන්වර් සදාක් මැතිතුමා.</u>**

RF-4767 අංක දරණ ට්‍රැක්ටර් රථය සඳහා නව බැටරියක් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික -එච්.එම්.නාසීම් මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ ඒකඡන්දයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක - XV.**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

2022 වර්ෂයේ අයවැයෙන් විමධ්‍යගත වැඩසටහන යටතේ පෙර පාසල් සඳහා ද්‍රව්‍යාධාර ලබා දීම සඳහා එක් සභිකවරයෙක් සඳහා රු.50,000.00 ක මුදලක් වෙන් කර ඇති බැවින් සහ ඒ අනුව මේ වන විට මුදල් පොතේ ප්‍රමාණවත් ශේෂයක් පවතින බැවින් ඒ සඳහා අනුමැතිය ඉල්ලමින් සංවර්ධන නිලධාරී එස්.එම්.ආර්.එස්.පී.කේ.උඩුගොඩ මිය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහා සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කරනවා.

**යෝජනා අංක 177 – 11-2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික -ඒ. අන්වර් සදාක් මැතිතුමා.**

විමධ්‍යගත වැඩසටහන යටතේ පෙර පාසල් සඳහා ද්‍රව්‍යාධාර ලබා දීම සඳහා එක් සභිකවරයෙක් සඳහා රු.50,000.00 ක මුදලක් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා සභික - බී.ආර්.තිලක් සුසන්ත රාජකරුණා මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ ඒකඡන්දයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**(ඊ) කාරක සභාවල වාර්තා ඉදිරිපත් කිරීම.**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම යටතේ පහත සඳහන් කමිටු වාර්තා ගරු මහ සභාවට ඉදිරිපත් කර සිටිනවා.

I. 2022.10.12 වන දින පැවති ළමා හා කාන්තා කමිටු වාර්තාව.
II. 2022.10.17 වන දින පැවති කාර්මික කමිටු වාර්තාව.
III. 2022.09.15 වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව.
IV. 2022.10.20 වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව.

**ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

නිවාස කමිටුව විදිහට හිඟකඩකාමර මුදල් විශාල ප්‍රමාණයක් සමථ මණ්ඩලයට යොමු කර අපි අය කර ගැනීම සිදුකළා.මේ හිඟ මුදල් පිළිබඳ වාර්තාවක් මහ සභාවට ඉදිරිපත් කළ යුතුයි.බැකෝ ලෝඩර් යන්ත්‍රයේ ඉන්ධන අස්ථානගත වීම සම්බන්ධයෙන් මුර සේවකයන්ගේ සහ රියදුරන්ගේ වැටුපෙන් අය කර ගන්නා ලෙස අපි කමිටු තීරණයක් ගත්තා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජයතිලක මැතිතුමා.</u>**

මේ සම්බන්ධයෙන් නිශ්චිතවම කරුණු සොයා ගෙන නැහැ.මේ ගැටළුව දිගින් දිගට සිදුවන ක්‍රියාවලියක්.මේ පිළිබඳව සියළුමදෙනා ගෙන්වා හොරා කවුද කියන දේ සොයා ගත යුතුයි.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

බාහිර පුද්ගලයෙක් මේසඳහා සම්බන්ධයි කියලා අපිට දැනගන්න ලැබිලා තියෙනවා.මම දැක්කා මේ සභාවට කිසිම සම්බන්ධයක් නැති කෙනෙක් ඇවිත් ඉන්නවා.ඒ සම්බන්ධව විමසීම් කිරීමේදී අපිට දැනගන්න පුළුවන් වුනේ වතුර ගේන්න එනවා කියලා.සවස 4.15 න් පසු වතුර ලබා දීම නවත්වන එක සුදුසුයි.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මම ගෙදර ඉන්න වේලාවේ මට දුරකථන ඇමතුමක් ආවා.සභාව ඇතුළේ කුඩු කාරයෝ දෙදෙනෙක් ඉන්නවා කියලා.මම ඒ වෙලාවේම ඇවිත් ඒ පිළිබඳව සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කළා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජයතිලක මැතිතුමා.</u>**

එක්තරා පුද්ගලයෙකුගේ මළ ගෙදරක් අවසන් වෙන තෙක් මේ සභාව හෝටලයක් බවට පත් කර ගෙන තිබුණා.ඒ කටයුත්ත දිගින් දිගටම සිදු වෙනවා.සේවා කාලයෙන් පසුව සභා භූමියට කිසිම කෙනෙක් ගෙන්වා නොගත යුතුයි ලෙස මම මෙම සභාවට යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - පී.මධුර කුමාර පියරත්න මැතිතුමා .</u>**

ප්‍රාදේශීය සභාවේ පාලකයෝ විදිහට අපි තමා මේ සම්බන්ධයෙන් සැළකිළිමක් විය යුත්තේ. සේවා කාලයෙන් පසුව සභා භූමියට කිසිම කෙනෙක් ගෙන්වා නොගත යුතුයි ලෙස ගෙන ආ යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ ඉදිරිපත් කිරීම.</u>**

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

2022 ඔක්තෝබර් මස ආදායම් වියදම් අයකර ගැනිම පිළිබඳ මාසික ප්‍රගති වාර්තාව (එල්.ජී.06) හා මාසික වියදම් වාර්තාව (එල්.ජී.13) ගරු මහා සභාවේ දැන ගැනිම සඳහා මෙන්ම අනුමැතිය සඳහා ද ඉදිරිපත් කරනවා.

**<u>යෝජනා අංක 178–11-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, සියළුම දෙනාගෙන් අවසරයි. සභාවට ඉදිරිපත් කරන ලද 2022 ඔක්තෝබර් මස ආදායම් වියදම් අයකර ගැනිම පිළිබඳ මාසික ප්‍රගති වාර්තාව (එල්.ජී.06) හා මාසික වියදම් වාර්තාව ( එල්.ජී.13) සත්‍ය වාර්තා බවට මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - බී.ආර්.තිලක් සුසන්ත රාජකරුණා මැතිතුමා.</u>**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ ඒකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>(ඌ) නොපැමිණෙන මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අවසර ලිපි ඉදිරිපත් කිරිම.</u>**

කිසිවක් නැත.

**<u>(එ) ගරු සභිකවරුන්ගේ වෙනත් අදහස් ඉදිරිපත් කිරිම.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

තිරප්පනේ ප්‍රාදේශීය සභාවේ හිටපු මන්ත්‍රීවරයෙක් වන ඉලංගසිංහ රත්නායක මැතිතුමාගේ පියාට නිවන් සුව අත්වේවායි මම ප්‍රාර්ථනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.</u>**

එතුමන්ගේ පියාණන් මේ වන විට මිය ගොස් සිටිනවා එම නිසා අපි සියළු දෙනාම ඒ අවස්ථාව සඳහා සහභාගී වෙමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ආර්. ප්‍රියංගන ප්‍රසාද් කුමාර රත්නායක මැතිතුමා.</u>**

අපේ ගමේ පන්සල හදන්න ගම් 03 ක් එකතු වෙලා මුල්ගලක් තිබ්බා.බුදු දහම අදහන අයට පන්සල් හදන්න දෙන්න බැහැ කියලා කියලා තියෙනවා.දහම් පාසල් ගොඩනැගිල්ලට මුල් ගල තියද්දී ඒක වැඩේ නතර කළා.පන්සල හැදීම නතර වුවහොත් මේ පිළිබඳ සොයා බලන ලෙස මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

පන්සලක් හදන්න යනකොට අවශ්‍ය ස්ථාන වලින් අවසර ගත යුතුයි.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - පී.මධුර කුමාර පියරත්න මැතිතුමා .</u>**

රත්නායක මන්ත්‍රිතුමා කථා කළා පන්සලක් සෑදිම සම්බන්ධයෙන්.වෙල්ලමුදාව තුලානට පන්සලක් අවශ්‍යමයි.ඒ සඳහා කවුරු හරි විරුද්ධ වෙනවා නම් රත්නායක මන්ත්‍රීතුමාට මම ඒ සඳහා සහයෝගය ලබා දෙනවා.අපි සියළු දෙනා මේ සඳහා සභා අනුමැතියක් ලබා ගෙන අවශ්‍ය සියළු සහයෝගය ලබා දිය යුතුයි.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

රත්නායක මන්ත්‍රිතුමා ඔබතුමා අත්අඩංගුවට නොගැනීම සම්බන්ධයෙන් සතුටු වෙන්න.අපිට ගමට පන්සලක් ඕනේ.මේ සඳහා අදාළ ආයතන වලින් සහ අදාළ ප්‍රදේශය භාර නායක ස්වාමීන් වහන්සේගෙන් අවසරය ලබා ගත යුතුයි.ඒක නීතියක්.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජයතිලක මැතිතුමා.</u>**

මුල වරද්දගෙන තමයි ඉන්නේ.ආගමට දහමට ලැදිද තණ්හාවට අශාවට ලැදිද කියන එක පළමුව වටහා ගත යුතුයි.සභාපතිතුමා,ලබුනෝරු කන්දෙ ඉදිකිරීම් ප්‍රශ්ණයට මොකද වුණේ?

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

එතනදී අපි කමිටුවක් විදිහට නැවත කිසිදු ඉදිකිරීමක් සිදු නොකරන ලෙසත් දැනට ඇති ඉදිකිරීම් නිත්‍යානුකූල කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ගන්නා ලෙස දන්වා සිටියා.වෙනත් යෝජනාද ඉදිරිපත් කිරීම අවසන් බවට පෙනී යන හෙයින් ,ඒ අනුව අද දින මහ සභාවට පැමිණි සියළු දෙනාටම බෙහෙවින් ස්තුතිවන්ත වෙමින් ගරු මහ සභාවේ කටයුතු මෙයින් හමාර කරනවා.

2022.11.10 වන දින පැවති ගරු මහ සභාවේ වැඩ කටයුතු මධ්‍යාහන 12.00 ට පමණ අවසන් විය.